# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2013/35 - 2017 අප්‍රේල් මස 07 වැනි සිකුරාදා - 2017.04.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : අකු 4/1/1/33.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2012/පීසී/305.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ ගම්පහ කෝරළයේ සුළු කොට්ඨාසයේ, පන්ගොල්ලාමඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2014.03.24 දිනැතිව මැන සකස් කරන ලද, අංක මහ/6352 දරන මූලික පිඹුරේ කැබලි අංක 03 වශයෙන් දැක්වෙන "තැන්නවත්ත" නමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0394 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල.

**කැබලි අංක 03**

ඉඩමේ නම: තැන්නවත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : සභාපති, පන්ගොල්ලාමඩ සුභසාධන සමිතිය, අංක 253, පන්ගොල්ලාමඩ, අකුරණ; ප්‍රමාණය: හෙක්. 0.0394.

*මායිම්:*

උතුරට: කැබලි අංක 01 ප්‍රාදේශීය සභා මාර්ගය සහ එස්. එච්. එල්. එම්. අහමඩ් හිමිකම් කියන මිල්ලගහමුල වත්ත; නැගෙනහිරට: එස්. එච්. එල්. එම්. අහමඩ් හිමිකම් කියන මිල්ලගහමුල වත්ත; දකුණට: එස්. එච්. එල්. එම්. අහමඩ් හිමිකම් කියන මිල්ලගහමුල වත්ත, ප්‍රාදේශීය සභා මාර්ගය සහ එම්. එස්. එෆ්. සිෆානා හිමිකම් කියන තැන්නවත්ත; බටහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය, එම්. එස්. එෆ්. සිෆානා හිමිකම් කියන තැන්නවත්ත, කැබලි අංක 2 සහ 1.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ජූනි මස 01 වැනි දින පෙ. ව. 10.00ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සම්මුඛ විය යුතුයි.

තව ද, 2017.06.15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

මාධව වර්ණකුලසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2017 අප්‍රේල් මස 04 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 673

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 25393 - 29 (2017/04)

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ව/18/56/2001/IV.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 1992/47 හා 2016 නොවැම්බර් මස 10 වැනි දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* වත්තල ප්‍රාදේශීය ලේකම් විසින් පළකරන ලද මූලික පිඹුරු අංකය ගම් 3716 දරන පිඹුරේ කැබලි අංක 119 හා 120 පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

**කැබලි අංක 119**

ඉඩමේ නම: ගුවන් හමුදාවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 1ක්, සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් සහ වැසිකිලියක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. ඩී. ඩී. මල්කාන්ති මුණසිංහ, අංක 113, සන්රයිස් මාවත, මත්තුමගල, රාගම; ප්‍රමාණය: හෙක්. 0.0126.

**කැබලි අංක 120**

ඉඩමේ නම: ගුවන් හමුදාවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. ඒ. එල්. එස්. නයනා මුණසිංහ, අංක 5, ධර්මදාස මාවත, ඇලපිටිවල, රාගම; ප්‍රමාණය: හෙක්. 0.0038.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ කැබලි අංක 119 - 120 දක්වා 2017 අප්‍රේල් මස 28 වැනි දින පෙ.ව 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 අප්‍රේල් මස 28 දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2017 මාර්තු මස 29 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 674

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ව/18/56/2001/III.

වර්ෂ 2010 ක් වූ මාර්තු මස 16 වැනි දින අංක 1645/12 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ සඳහන් මූලික පිඹුරු අංකය ගම් 3712 දරන පිඹුරේ කැබලි අංක 20, කැබලි අංක 35 සහ 36 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමු.

**කැබලි අංක 35**

ඉඩමේ නම: මාදන්ගහ කුඹුර, වැටකෙයියාගහ කුඹුර; විස්තරය: වගුරුබිම (අත්හරින ලද කුඹුර); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එච්. පී. අජිත් වේලෙන්ටන්, අංක 622, තුඩුවේගෙදර, රාගම; ප්‍රමාණය: හෙක්. 0.6429.

**කැබලි අංක 36**

ඉඩමේ නම: මාදන්ගහ කුඹුර, වැටකෙයියාගහ කුඹුර; විස්තරය: වගුරු බිම (අත්හරින ලද කුඹුර); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එස්. ඒ. එම්. පී. සමරවීර, එච්. ඩී. පී. මිල්රෝයි, එච්. ඩී. ඇන්ටනි, එච්. ඩී. සිරිල්, එච්. ඩී. කිස්ට්පෝල්, එච්. ඩී. බී. බොනිටා, එච්. ඩී. එම්. පැට්‍රිෂියා, එච්. ඩී. එස්. අප්පුහාමි, එන්. එම්. ඩී. ජේ. කේ. පද්මසිරි, එන්. එම්. ඩී. වයි. නිලන්ත, එච්. ඩී. ලියෝන් සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 1.7322.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ කැබලි අංක 35 - 36 දක්වා 2017 අප්‍රේල් මස 28 වැනි දින පෙ.ව. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2017 අප්‍රේල් මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2017 මාර්තු මස 29 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 675

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.